# මහනා හිමියන්ගේ අනුශාසනය හා අභියෝග






මෙරමා දොස්ම දිස්නේ
තමා වරදම නොදිස්නේ

යයි ලියුවේ රජ කෙනෙකි. ඒ නිසා රජුන්ට අවවාද කරන මහා සංඝරත්නයට එය පැහැදිලි කරදිය යුතු නොවේ.

පුවත්පතකට ප්‍රකාශයක් නිකුත් කිරීම සාමාන්‍යයෙන් දේශපාලකයන්ට පුරුදු වූ ක්‍රියාවකි. එය ඔහුට ප්‍රචාරයක් ලබා ගැනීමට ඇති පහසුම ක්‍රමයයි. නළු නිළියන් එසේ කළ යුතු නැත. පත්තරකාරයන් ඔවුන් පස්සේ යන නිසාය. දේශපාලකයන් පස්සේ යන අයද සිටිති. එසේ එන තැනට මං පාදා ගැනීමට සමත්තුද දේශපාලකයන් අතර ද සිටිති.

ශ්‍රී ලංකාවේ මේ ක්‍රියා මාර්ගයට පිවිසි නවතම චරිතය අස්ගිරියේ මහ නාහිමියෝය. උන් වහන්සේ විසින් පුවත්පත්වලට කරන ලද වැදගත් ප්‍රකාශ ගණනාවක් මෑතක පළවිය. මට මතක ඇති පළමු ප්‍රකාශය රජයට කරන ලද අභියෝගයකි. තරවටුවකි. විහාර පන්සල් දේපළ වලට අත ගැසීම නොහොත් ඒවාට අහිතකර නීති රීති පැනවීම සිදු කළ හොත් පාරට බසින බව උන්වහන්සේ පවසා තිබුණෝය. පාරට බැස විරෝධය පෑම දැන් සරසවි සිසුන්ද පුරුදු වූ ක්‍රමයයි. දැන් බහීවි - දැන් බහීවි - කියා බලාගෙන සිටියත් තවම බැහැපු වගක් ආරංචි වූයේ නැත .

ඊළඟ මහ නා හිමි ප්‍රකාශයත් රජයට එල්ල කරන ලද අභියෝගයක්මය. රජයේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ශාසනයට අහිතකර බව ඒ ප්‍රකාශයේ කියැවිණ. මට එක් වරටම මතක් වූයේ බෙංගමුවේ නාලක හාමුදුරුවන් ලියූ "බොදු සසුන වනසන කඳ පණුවෝ" නම් පොතය. මට ලැබුණ පොත කියවීමට නොසිතුණේ මා ශාසනාරක්ෂක සංගමයට බැඳීමට කල්පනා නොකළ නිසාය. කඳ පණුවා නැසීමට කඳට බෙහෙත් කිරීම ගිහියන් අත නොගැසිය යුතු කාරියක් බව මම සිතමි. බෙංගමුවේ හාමුදුරුවන්ද කඳ පණුවන් හඳුනාගෙන ඇතුවාට සැකයක් නැත .

හඳුනා නොගෙන ඒ ගැන කතා කිරීම නිසා සිදුවන්නේ මොකක්දෝ රෙද්ද පල්ලේ දමාගෙන කනවෝ යයි කෑ ගැසූ මනුස්සයාට වෙච්ච දේය. ඒ නිසා ගිහියෝ ඒවාට අත නොගසා සිටීමට පුරුදු විය යුත්තෝය.

දැන් තුන්වැනි ප්‍රකාශය. එය නම් අතිශය කාලෝචිත වූවකි. තමාට පැවරෙන මහජන සේවය හරිහැටි ඉටු නොකරන දේශපලකයන්ට හා රජයේ සේවකයන්ට ඉදිරි අත්බවෙක එයට වන්දි ගෙවීමට සිදුවන බවය උන් වහන්සේ කියා වදාළේ. මේ මගේ වචනය. පින් පව් ගැන කියා තිබුණාදැයි මට මතක නැත . වගකීම ඉටු නොකිරීමේ ආදීනව මේ අත්බවේදීම ලැබෙනවා දකින්නට මම කැමැත්තෙමි. ඉදිරිය බලාගෙන නිවන් මග පෙන්වා දෙන උන්වහන්සේගෙන් වෙනස් විදියක උපදෙසක් පැතිය හැකිද නොවේ.

ශ්‍රී ලංකාවේ ඇමතිවරුන් කිහිපදෙනකු මහ නාහිමිවරුන්ට තතු පැහැදිලි කර දුන් බව පුවත්පත් වාර්තා කළේ මේ ප්‍රකාශ වලට පසුවය. මෑතක ය. ඒ සත් ක්‍රියාව ගැන අදාල මන්ත්‍රීවරුන්ට මගේ ප්‍රශංසාව හිමි වග පළමුකොට සඳහන් කළ යුතුය. මගේ ප්‍රශංසාව ඔවුන්ට උවමනා නැති බව දැන දැනම එසේ කියන්නේ අර කියාපු මහ නා හිමියන් ඇතුළු ශ්‍රී ලංකාවේ මහං සංඝරත්නයට මෙතෙක් අවංකව තිබුණු වැදගත් ප්‍රශ්නයක් (නාලක හිමියන්ගේ වචනයෙන් කියතොත් කඳ පණු උවදුරක්) ගැන මතක් කරදීමට ඔවුන් ඉදිරිපත්වීම නිසාය.

නව මාදිලියක - නව පන්නයක සඟ පරපුරක් ශ්‍රී ලංකාවේ බිහිවීම පමණක් නොව ඒ පුද්ගලයන්ට උඩ ගෙඩි දෙන දේශීය හා විදේශීය බෞද්ධයන් සිටීමද ඇදහිය නොහැකිය. එහෙත් වරක් ඇමරිකාවට යාමට බෞද්ධයන් අනුග්‍රහය නොදැක්වූවා නම් එකත් එකට වාර්තා වුණු විදියට නෝර්වේ ජාතික පින්වතුන් විසින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැළසූ බව හිතා ගත හැකිය.

කඳ පණුවන් අහුලන නාලක හාමුදුරුවන්ට මෙසේ බිහි වී - බෝ වී - සකල සරීරයම වසාගෙන පැතිරී යන තෙක් මේ පණු උවදුර නොපෙනුනේද? අස්ගිරියේ මහ නා හිමියන් පන්සල් දේපළ රැක ගැනීමට බලන අතරේ මෙහෙවු පුද්ගලයන් රට තුළ කරන විගඩම් නොදුටුවෝද? බොදු බලය වූ කලී නයා පෙනය පුප්පන විදියට ප්‍රදර්ශනය කළ යුත්තක් නොවන බව කියා දීමට ඇමතිවරුන් හෝ ගිහියන් අවශ්‍යද? ඈහේ තියෙන පොල් පරාලය පෙන්වා දීමට සාමනේරනමක් වත් ඔය පන්සල්වල නැද්ද?

ගරුතර මහා සංගරත්නයට කළ නොකළ යුතු සුදුසු නොසුදුසු මොනවාදැයි කියා දීම ගිහියකුට කළ හැක්කක් නොවේ. ගිහියන් අත ගැසිය යුත්තක්ද නොවේ.

"මට මේ චීවරය පොරවනු මැනවැ"යි භික්ෂුභාවය අපේක්ෂක දරුවා කියන්නේ අමුතු ගමනක් යාමට සැරසී ගෙනය. ඒ යන ගමන දියවන්නා ඔය අයිනේ ලැගුම් ගෙන යන එකක් නොවන බව ඔහුට (දැන් හාමුදුරුවන්ට) කියා දීමට අප වැන්නන්ට පුළුවන්ද? පාර්ලිමේන්තුවට ගිය භික්ෂූන් තමන්ට ලැබුණ රථය විකුණා මුදල් උපයන විට එය අර ගමනට බාධාවක් යයි කියන්නට කෙනෙක් නොසිටියෝද? එක අතකින් එය තේරුම්ගත හැකි තත්වයකි. බුදුන්ගේ කාලයේ ඔය වාගේ යාන වාහන තිබුණේ නැත . උන් වහන්සේ මධ්‍ය දේශය පුරා දම් දෙසමින් පයින්ම ගමන් කළ නිසාය. බෙන්ස් කාර් තිබුණා නම් අනේපිඩු සිටාණන් වසරක් ගානේ සලුන් රථයක් පූජා කරනවාට සැකය-ක්ද නැත . කාර් නැති අවදියක කාර් බිස්නස් නොතිබීම අරුමයක්ද? එහෙව් එකේ උන් වහන්සේ ඔය නැති ගමන් හා වාහන ගැන විනය නීති පනවන්නේ කෙසේද?

අලුතින්ම මහ විනාශයකට මුල පිරූ රථ ප්‍රශ්නයට මුල් වූ ප්‍රකට භික්ෂුවක් ගැන පරණ සිද්දියක් මට කීවේ එවක කළුතර සේවය කළ පොලිස් නිලධාරියෙකි. භික්ෂුන් වහන්සේගේ රියැදුරා ලෑල්ලට පාගා රිය පදවාගෙන අවාලු. එය නැවැත්වූ පොලිස් භටයාට පහර දීමට රියැදුරා හෝ හාමුදුරුවන් හෝ එළියට බැස්සේ නැත .

"තමුසෙ දන්වාද මම කවුද කියලා..?"

කතාව අවසානයේ හාමුදුරුවන්ට වැඳ නමස්කාර කළ පොලිස්භටයා රියට ඉදිරියට යාමට ඉඩ දුන්නේය. කතාව එතනින් හමාර නැත . හාමුදුරුවන්ට හොඳටම තද වෙලාය. කොළඹට ආපු ගමන් කතා කළේ ඉහළ නිලධාරියකුටය. පොලීසියේ ලොක්කකුටය. තමාට වූ අසාධාරණය ගැන පැමැණිලි කිරීමටය. තමන් බඳු බලවතෙකුගේ රිය නවත්වා ප්‍රශ්න කිරීමට තරම් අවංක වූ අර පුංචි පොලිස්කාරයා කළ වැරැද්ද කියන්නටය.

දුරකතන ඇමතුම ගත් උසස් නිලධාරියාත් හෙල්ලුම්කාලාය. "මම ඒ ගැන ක්‍රියා කරන්නම්" යයි පිළිතුරු දුන් ඔහු කළුතර පොලීසියට අවශ්‍ය උප-දෙස්ද දුන්නේය. එහි සිටි උඑ පොලිස් අධිකාරී කොළඹට අවුත් පැමිණිලිකාර හාමුදුරුවන් ගෙන් සමාව ඉල්ලීමය. අහක යන මහ සඟරුවනක් නිසා තමන්ට විඳින්නට සිදු වූ නව නිග්‍රහය ගැන ඔහු සදහටම පසු තැවෙනවා ඇත .

මහ නා හිමියනි, මේ කියන හාමුදුරුවන්ගේ ඔබ වහන්සේගේ බල ප්‍රදේශයට අයත් නොවන බව දනිමි. එහෙත් සියම් නිකායට අයත් නිසාවත් ඔබ වහන්සේට යමක් කළ හැකි විය යුතුය. මෙහෙවු කෙළි කායන් සිවුරු දරාගෙන පිණුම් ගැහුවේ අද ඊයේ නොවේ.

පල්ලිවලට කඩා වැදීම හා මුස්ලිම් ජාතික ව්‍යාපාර ආයතනවලට හානි කිරීම බඳු ක්‍රියාවන්හි නිරත වන සඟ පරපුරක් බිහිවීම නම් පිරිසිදු බුදු දහම රැකගෙන ආපු දහම් දිවයිනේ දක්නට ලැබුණ නව ප්‍රවණතාවක් බව කිව යුතුය. ඔබ වහන්සේලාගේ අඩවිය තුළ මෙතරම් ප්‍රශ්න හා විපිරියාසු තිබියදී රජයේ සේවකයන්ගේ වගකීම් වැනි කතා කිරීම තරම් විහිළුවක් තවත් ඇද්ද? එයත් අබුද්දස්ස කාලේ ලක්ෂණයක්ද?

Tutoring

22 years of experience in tutoring in Melbourne with Proven Results.......!

Coaching for
- Mathematics for Primary and Secondary
- VCE Mathematics: Mathematical Methods, General Mathematics, Further Mathematics, Specialist Mathematics
- VCE Physics
- English from Primary to year 9
- Science for Secondary

- Scholarship and Selective School exams
  Melbourne High, Mac.Robertson, Suzanne Cory, Uni High, John Monash, Ivanhoe Grammar, Trinity Grammar, Melbourne Grammar, PEGS, etc.

Small groups - up to 4 students.....!
Individual classes on request

Neranjana Kudaligama
0408 356 821
Masters in Accounting (La Trobe)
B. Applied Science (Computer Science and Software Engineering) (Swinburne)
Civil Eng. (Moratuwa)
Ex. Teacher, VSL - Roxburgh Park Sinhala School

Hemantha Devendra
0409 854 597
VIT Registered Teacher
Post Grad. Dip Edu.(La Trobe)
B. Design (Industrial Design) (RMIT)
Mech Eng (Moratuwa)

VCE Chemistry 2014

Individual and Groups
Early completion of syllabus and Exam preparation
Home Visited

Priyantha Liyanage
0407664546